දිවුලපිටිය ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ,ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.28 අනුව හා එහි පරිශිෂ්ඨය 2 හි පහදා දීම් හා මගපෙන්වීම් හි EG 6.2 අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනයේදී සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස ගලපා තිබූ මූල්‍ය පිරිවැය රු.226,922 ක් අතිරික්තයට නැවත ගැලපුම් කර නොතිබුණු අතර අතිරික්තයට ගලපා තිබූ රු.533,576 ක වටිනාකම කුමක්ද යන්න අනාවරණය නොවුණි. තවද විස්තීර්ණ ආදායමට ගලපා තිබූ රු.12,738,051 ක පොලී ආදායමෙන් රු.11,692,489 ක් පමණක් අතිරික්තයට නැවත ගලපා තිබුණි.	මූල්‍ය පිරිවැය රු.226,922 විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස ගලපා ඇති බවත් අතිරික්තයට ගලපා තිබූ රු.533,576 වටිනාකම සමුච්චිත අරමුදලට බැරකල රු.74,038,112 ට සිදුකල ගැලපීම් බවත් විස්තීර්ණ ආදායම තුල පොලී ආදායම රු.12,738,051 ක් ඇතුලත් බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.30 අනුව හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මගපෙන්වීම් හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලද ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු. 90,819,390 ක් විය යුතු වුවත් ලැබිය යුතු වටිනාකම රු.30,341,511 ක් ද ඇතුලත්ව රු.121,160,901 ක් දක්වා තිබුණි. 2023 වර්ෂයට අදාලව ලැබිය යුතු සමාලෝචිත වර්ෂයේ ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.2,998,626 ක් සහ ණය පොලී ලෙස ගෙවා තිබූ රු.226,922 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ඇ)	පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 27 දිනැති අංක LGD / 09 /2019 (1) චක්‍රලේඛය අනුව මංමාවත් බෝක්කු හා පාලම් සහ සවිකිරීම් සටහන් කිරීම සඳහා LG ආකෘති භාවිතාකර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු ස්ථාවර තැන්පත් පොලිය රු.1,092,500 ක් වුවද රු.96,816 ක් වැඩියෙන් ස්ථාවර තැන්පතු ගිණුමට සහ ලැබිය යුතු පොලී ගිණුමට ගලපා තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.2,072,692 ක් වුවද රු.1,941,181 ක් ලෙස රු.131,511 ක් අඩුවෙන් දක්වා තිබුණි. එලෙසම සමාලෝචිත වර්ෂයට අදාල රු.11,917,815ක ස්ථාවර තැන්පතු පොලී ආදායම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ රු.11,692,489 ක් ලෙස ගලපා තිබීමෙන් විස්තීර්ණ ආදායම රු.225,326 කින් තවදුරටත් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී ගැලපීම් සිදුකරන බව.	පොලී ආදායම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	2023 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මගින් පෙන්වා දුන් සමුච්චිත අරමුදලට බැර කර තිබූ රු.1,196,293 ක පුස්තකාල පොත් පරිත්‍යාග වටිනාකම නිවැරදි කිරීමේදී ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම බැර කළ යුතු වුවත්, වෙනත් පරිත්‍යාග ගිණුමට බැර කර තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුලදී බාහිර පාර්ශවයන්ගෙන් ලද රු.275,563 ක් වටිනාකමැති පොත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් වෙනත් පරිත්‍යාග ලෙස දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඈ)	2022 වර්ෂයේදී කොටදෙනියාව පොල භූමියේ කසල වෙන්කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගෙවා තිබූ රු.1,498,198 ක් සහ කොටදෙනියාව සති පොල නවීකරණය සඳහා ගෙවා තිබූ රු.3,564,124 ක් වටිනා කාර්යයන් නිමකර තිබියදී සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඉ)	2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.171,631 ක සූර්ය පැනල කට්ටල ලබාගෙන සවිකිරීම් සඳහා මුදල් ලැබීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් ලෙස දක්වනු වෙනුවට ප්‍රාග්ධන ප්‍රදානවලට මාරුකර තිබුණු හෙයින් ප්‍රාග්ධන ප්‍රදාන වැඩියෙන් ද ආදායම අඩුවෙන්ද දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඊ)	2024 බස්නාහිර පළාත් සංවර්ධන සැලැස්ම යටතේ සූර්ය පැනල වීදි ලාම්පු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වූ රු.230,000 ක් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදාන ගිණුමට බැර කරනු වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැරකර තිබුණු හෙයින් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.230,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

(උ)	බලශක්ති කාර්යක්ෂම වීදි පහන් සැපයීමේ ව්‍යාපෘතියෙහි මුළු වටිනාකම වූ රු.8,113,680 ක් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් යටතේ දක්වා නොතිබුණු අතර පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදාන ලෙස දැක්විය යුතු සමාලෝචිත වර්ෂයේ ලද රු.7,302,312 ක් පොදු තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම ලැබියයුතු සියයට 10 ක රැඳවුම් මුදල වූ රු.811,368 ක් ලැබියයුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂයේ ආදායම රු.8,113,680 ක් හා ලැබියයුතු වටිනාකම රු. 811,368 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඌ)	උක්ත ව්‍යාපෘතියෙහි අදියර 02යටතේ ලැබිය යුතුව පැවති රු.17,496,450 ක් ද ,එම වටිනාකමට සමානව ලබාගත් වීදිපහන් භාණ්ඩවල වටිනාකම ණයහිමි ලෙස ද ගිණුම්ගත කර නොතිබුණි. ගබඩාවෙහි ඉතිරි වීදි පහන් භාණ්ඩ රු.10,364,897 ක් අවසන් තොග යටතේ ද ,භාණ්ඩ නිකුත්කර වැඩ අවසන් වටිනාකම රු.7,131,553 ක් පුනරාවර්තන වියදම් සහ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂයේ ඉදිකරමින් පවතින ගොඩනැගිලි යටතේ දක්වා තිබුණු රු.3,700,000 කින් රු.1,715,000 ක් ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් වශයෙන් ගිණුම්ගත නොකිරීමෙන් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් අඩුවෙන්ද ජංගම නොවන වත්කම් වැඩියෙන්ද දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඒ)	සමාලෝචිත වර්ෂයේ රු.300,000 ක ආයුර්වේද බෙහෙත් පරිත්‍යාග , පුනරාවර්තන වියදම් සඳහා ලද ප්‍රදාන ලෙස විස්තීර්ණ ආදායමෙහි නොදක්වා වෙනත් පරිත්‍යාග ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශයෙහි දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඔ)	2022 වර්ෂයේදී සභාව වෙත ලද රු.212,700,000 ක් වූ පොදු ඉඩම් කොටසක වටිනාකම ප්‍රාග්ධනිත කිරීමේදී පුනරාවර්තන ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමේ වරද 2023 වර්ෂයේදී නිවැරදි කිරීමේදී ප්‍රාග්ධන ප්‍රදාන බැර කළ යුතු වුවත්, වෙනත් පරිත්‍යාග ගිණුමට බැරකර තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඕ)	සමාලෝචිත වර්ෂයේදී ලද ප්‍රදානවලින් ඉටුකර තිබුණු පුනරාවර්තන ව්‍යාපෘති 19 ක එකතුව රු.12,141,044 ක වටිනාකම පුනරාවර්තන වියදම් සඳහා ලද ප්‍රදාන ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

(ක)	2023 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබූ විගණන ගාස්තු රු.305,941 ක් ද සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කළ රු.394,059 ක් ද ලෙස එකතුව රු.700,000 ක් විගණන ගාස්තු ලෙස දක්වා තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම රු. 365,941 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ග)	සභාවට අයත් ගොඩනැගිලි 03 ක් අළුත්වැඩියා සහ නඩත්තු කිරීම සඳහා දරන ලද රු.2,616,552 ක් ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කර තිබුණු හෙයින්, එම වටිනාකමින් වර්ෂය තුල වියදම් අඩුවෙන් සහ ජංගම නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ච)	ප්‍රාග්ධන ප්‍රදාන ආරම්භක ශේෂය තුල ඇතුලත් ජංගම නොවන වත්කම්වලට අදාලව වාර්ෂික ක්ෂය ප්‍රතිශතය අනුව වර්ෂය තුල වියදමට හඳුනාගත් ක්ෂය වටිනාකමට සමාන වටිනාකමක් සමාලෝචිත වර්ෂයේදී ආදායම ලෙස හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ලද ප්‍රාග්ධන ප්‍රදානවලින් වියදම් කළ ප්‍රමාණය වූ රු.30,959,165 ක් වර්ෂයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදාන යටතේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් ශේෂ 08 ක් හා ඒවාට අදාළ උපලේඛනවල එකතූන් අතර රු .23,480,473 ක් වූ වෙනසක් පැවතුණි.	2025 මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරන බව.	මගින් වෙනසට හේතු සොයා නිවැරදි කරගත යුතුය.

1.7 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති			
	(i) රීති 338, 344 සහ 397	සභාව විසින් වාර්ෂිකව බදු ලබාදෙන දේපළ 17 ක් බදු ලබාදීමේදී රීති අනුව කටයුතු කර නොතිබුණි.	විමසුම පිළිගන්නා බව.	යොමුගත රීති අනුව කටයුතු කළ යුතුය.

	(ii) රීති 433	යම් දේපළ පිරියත උපකරණ පන්තියක් හෝ පන්ති හඳුනානොගත් සභාවක් පසුව එළඹෙන වාර්තාකරණ දින අදාළ පන්තියක හෝ පන්ති තුළ වන දේපළ පිරියත හා උපකරණවල වෙළඳපල අගය හඳුනාගෙන එම අගය ධාරණ අගය ලෙස හඳුනාගත යුතු වුවද ප්‍රත්‍යාගණන කමිටුව විසින් ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයට යොදාගත් පදනම විගණනයට අනාවරණය නොවීය.	විමසුම පිළිගන්නා බව.	යොමුගත රීති අනුව කටයුතු කළ යුතුයි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571	වර්ෂ දෙක ඉක්මවූ රු3,859,426 ක ඉකුත් තැන්පතු නියාදනය කර නොතිබුණි.	තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරණ චක්‍රලේඛය, 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 හා 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(i) දරණ පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය	ගිවිසුම්ගත කාලය අවසන් වීමෙන් පසු බදු කුලී සංශෝධනය කර නැවත ගිවිසුම්ගත විය යුතු බවත්, බදු කාලසීමාව කොපමණද යන්න තීරණය කර ගිවිසුම්ගත විය යුතු බවත් සඳහන් වුවද, වසර 15 කට අධික කාලයක් පසුවී තිබියදී හා බදුකරුවන් වෙනස්වී තිබියදී තුරුසෙවන කඩ කාමර බදුකරුවන් හඳුනාගෙන ගිවිසුම් ගත වීමට කටයුතු කිරීමක් හෝ එම කඩ අතුරු බදුකරුවන් විසින් භාවිතා කරයි ද යන්න හඳුනා ගැනීමක් හෝ සිදුකර නොතිබුණි.	පිළිගන්නා බව.	චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.
(ඈ)	2024 දෙසැම්බර් 06 දිනැති අංක LGD/01/2024 දරණ පළාත් පාලන චක්‍රලේඛය	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙහි ආකෘති අනුව සේවක ණය සම්බන්ධව වාර්ෂික ණය සීමා අනුමත කරගෙන නොතිබුණි.	පිළිගන්නා බව.	චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.5,803,231 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.77,987,661 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31දිනට මුළු හිඟය
....	....	....	....	....	....	....	....	....
	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'
වරිපනම් හා බදු	14,040	15,214	15,025	189	15,000	14,473	13,446	403
කුලී	8,822	10,859	10,753	105	7,269	8,079	7,955	111
බලපත්‍ර ගාස්තු	,2044	2,078	2,078	-	,2272	2,069	2,069	-
වෙනත් ආදායම්	188,490	122,616	122,616	-	24,857	22,890	22,890	-
	------------	----------	---------	---------	-----------	---------	--------	-------
	213,396	150,767	150,472	294	49,398	47,511	46,361	514
	=======	=====	======	=====	=======	=====	=====	====

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 වර්ෂයේදී ලැබී තිබුණු මහජන පැමිණිලි 07 ක් සහ සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු මහජන පැමිණිලි 08 ක් 2025 අප්‍රේල් 30 දින වන විටත් විසඳා නොතිබුණි.	සිහිකැඳවීම් යවා ඇති බව.	මහජන පැමිණිලි හැකි ඉක්මනින් විසඳීමට කටයුතු කළ යුතුය.

3.2 **කළමනාකරණ** අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නොසැසඳීම් ලෙස හඳුනාගෙන තිබූ එකතුව රු.220,120,170 ක් වූ තොග අයිතම දෙකක වටිනාකම පරික්ෂාකර බලා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	වෙනස හඳුනාගෙන නිවැරදි කරන බව.	වෙනසට හේතු සොයා නිවැරදි කරගත යුතුය.
(ආ)	2007 වර්ෂයේ සිට පැවත එන රු.593,867 ක් වූ ඉන්ධන හා රු.2,480,411 ක් වූ වෙනත් අත්තිකාරම් ශේෂ එකතුව වූ රු.3,074,278 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් නිරවුල් කර නොතිබුණි.	පළාත් පාලන කොමසාරිස් උපදෙස් පරිදි කටයුතු කරන බව.	අත්තිකාරම් ශේෂ නිරවුල් කර ගත යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර වත්කම් එකතුකිරීම් යටතේ දක්වා තිබූ එකතුව රු.75,601,641 ක් වූ අයිතම 06 කට අදාල ජ'නල් වවුචර් හෝ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	පළාත් පාලන කොමසාරිස් උපදෙස් පරිදි කටයුතු කරන බව.	විගණනයට සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භ දිනට රු.356,361,041 ක්වූ ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලට අදාල විස්තරාත්මක උපලේඛන පිළියෙළ කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ආරම්භක ශේෂය බව.	විගණනයට සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා මිලදී ගැනීම් රු.17,202,703 ක් ද පාරවල් බෝක්කු හා පාලම් අළුත්වැඩියාව හා නඩත්තු රු.19,816,298 ක් ද වශයෙන් වූ ව්‍යාපෘති දෙකකට අදාලව එකතුව රු.37,019,001 ක් වූ වියදම පුනරාවර්තන වියදම් ලෙස සැලකීමට යොදාගනු ලැබූ පදනම කුමක්ද යන්න විගණනයට ඉදිරිපත් කිරීමට කළමනාකරණය අපොහොසත් විය .	පළාත් පාලන කොමසාරිස් උපදෙස් පරිදි කටයුතු කරන බව.	විගණනයට සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ඉඩම්, පොදු ළිං සහ පොදු සුසාන භූමි ආදී දේපළ 281 ක එකතු වටිනාකම වූ රු.493,699,407 කට අදාලව හිමිකම තහවුරු කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	පළාත් පාලන කොමසාරිස් උපදෙස් පරිදි කටයුතු කරන බව.	දේපලවල හිමිකම තහවුරු කර ගත යුතුය.
(උ)	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල ගොඩනැගිලි අයිතම 99 ක ,සවිකිරීම් අයිතම් 41 ක පරිගණක අයිතම 43 ක, කාර්යාල උපකරණ අයිතම 56 ක හා ලී බඩු උපකරණ අයිතම 25 ක තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනවල යාවත්කාලීන කර නොතිබුණු අතර මංමාවත්, පාලම්, බෝක්කුවලට අදාලව ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.	පිළිගන්නා බව.	ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.

(ඌ)	2022 ජනවාරි 27 දිනැති අංක 2264/ 18 දරන ගැසට් නිවේදනයේ 'ඇ' අනුව 2024 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	පිළිගන්නා බව.	පරිසර බලපත්‍ර සමීක්ෂණයක් වාර්ෂිකව සිදුකළ යුතුය.
(එ)	පොදු තැන්පත් ලේඛනයෙහි වර්ෂ 14 කට වඩා පැරණි නිලධාරින් 19 දෙනෙකුගෙන් වැඩිපුර අයකර ගැනීම් එකතුව රු.131,572 ක් පුද්ගල අනන්‍යතාවය හඳුනාගෙන පියවීමට කටයුතු කර නොතිබුණි.	කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව.	අනන්‍යතාවය තහවුරු කරගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඒ)	2012 වර්ෂයේ දී රු.495,000 කට නෙක්ෆා පරිගණක මෘදුකාංගය මිලදීගෙන වරිපනම් ආදායම් සඳහා පමණක් භාවිතා කරන නමුත් අනෙකුත් ආදායම් තොරතුරු පරිගණක මෘදුකාංගයට ඇතුලත් කර නොමැති බැවින් මෘදුකාංගය ලබා ගැනීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවී පැවතුණු අතර සභාව විසින් පරිගණක මෘදුකාංගය සැපයූ ආයතනය සමඟ ගෙවියයුතු සේවා ගාස්තු තීරණය කරමින් ගිවිසුම් ගතවීමක් ද සිදු කර නොතිබුණි.	කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව.	මෘදුකාංගය ලබා ගැනීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඔ)	2024 වර්ෂය සඳහා සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, ගැසට් පත්‍රය අනුව දැන්වීම් පුවරු ගාස්තුව වෙනස් වන බව අනාවරණය වුවද සභාව වෙතින් ඉල්ලුම් කරන ලද දැන්වීම් පුවරු ඉල්ලුම්පත්‍රයේ හෝ එහි ඇමුණුම් වල අදාල දැන්වීම් පුවරු වර්ගය සඳහන් කර නොතිබීමෙන් දැන්වීම් පුවරු ගාස්තු ගණනය කිරීමේ නිරවද්‍යතාවය ද විගණනයට තහවුරු කර ගත නොහැකි විය.	පිළිගන්නා බව.	වාර්ෂිකව දැන්වීම් පුවරු සමීක්ෂණයක් කළයුතු අතර ඉල්ලුම්පත්‍ර වල දැන්වීම් පුවරු වර්ගය සඳහන් කළ යුතුය.
(ඕ)	සභාව විසින් 2020 ,2021 සහ 2022 වර්ෂවලට අදාලව පිළිවෙලින් රු.26,800 ක් , රු.106,787 හා රු.35,000 ක් වූ එකතුව රු.168,587 ක කර්මාන්ත ණයහිමි ශේෂ පියවා නොතිබුණි.	පිළිගන්න බව.	හිඟ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය සඳහා බදු ලබාදුන් මස් කඩ හා මාළු කඩ 17 අතරින් කඩ 15 ක් ප්‍රසම්පාදනයේදී ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමකින් තොරව පෙර පැවති ටෙන්ඩර් මුදලටම යම් ප්‍රතිශතයක් එකතුකර කුලී අයකරමින් පැරණි බදුකරුවන් වෙත ගිවිසුම් ගතවීමකින් ද තොරව ලබාදී තිබූ අතර ප්‍රසම්පාදන දැන්වීමේ කොන්දේසි අංක 10 අනුව ගිවිසුම්ගතවීමේදී ටෙන්ඩර්කරු ඉල්ලුම් කරන මුදලින් සියයට 75කට සරිලන දේපල ඇපයක් තැබිය යුතු වුවද ගිවිසුම් අත්සන් කර ටෙන්ඩර් ලබාදුන් මස්කඩ 02 ක් සඳහා එවැනි දේපල ඇප ලබාගත් බවට අනාවරණය නොවීය.	පිළිගන්නා බව.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව දේපළ බදුදීම සිදු කළ යුතුය.

(ආ)	2008 පෙබරවාරි 18 දිනැති ලිපිය මගින් දිවුලපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් වල්පිට තුරු සෙවන අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ අලෙවි කුටි සභාව වෙත පවරා දී තිබූ නමුත්, සභාව විසින් බදුකරුවන් සමඟ ගිවිසුම්ගත වීම 2024 වර්ෂය දක්වා වසර 15 කට අධික කාලයක් ප්‍රමාද කර සභාව සමඟ නීතිමය බැඳීමකින් තොරව ඉහත කඩ කාමර බදු ලබාදුන් පාර්ශවයන්ගෙන් ආදායම් අයකරගෙන තිබුණි.	පිළිගන්නා බව.	දේපල බදු ලබාදීමේදී ගිවිසුම්ගත බැඳීමකින් යුතුව ආදායම් ඉපයීම සිදුකළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවෙහි දූනගහ උපකාර්යාලය සතු රන් එළදාගම ප්‍රජාශාලාව සහ බහුකාර්ය ගොඩනැගිල්ල, හොරගස්මුල්ල දික්වෙලයාය ප්‍රජාශාලාව සහ පුස්තකාල ගොඩනැගිල්ල, මරදගහමුල සිසිල සෙවන ප්‍රජාශාලාව සහ පෙර පාසල, දිවුලපිටිය වැසිකිළිය, මරදගහමුල කුණු එක්රැස්කරන ස්ථානය, ගල්කන්ද සතිපොල භූමියේ මස් වෙළෙඳසැල, අස්වැන්නවත්ත වලහේන ප්‍රජාශාලාව සහ කොටදෙණියාව (කළුඅග්ගල) උපකාර්යාලය සතු රේන්දපොල, අල්විස් සිල්වා බහුකාර්ය ගොඩනැගිල්ල සහ බඩල්ගම උපකාර්යාලය සතු බඩල්ගම සති පොල ගොඩනැගිල්ල හා මාළු කඩ, බඩම්පැල්ල හා බඩල්ගම පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර, උතුරු කළුවාරිප්පුව බහුකාර්ය ගොඩනැගිල්ල යන වත්කම් ප්‍රයෝජනයට නොගෙන ඌන උපයෝජිතව තිබුණි.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	සභාව සතු වත්කම් උපරිම එළදායී ලෙස ප්‍රයෝජනයට ගතයුතුය.

3.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කරනලද වටිනාකම රු.144,755,218 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 97 ක් දේපළ පිරියත උපකරණ ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.	පිළිගන්නා බව.	දේපළ පිරියත උපකරණ ලේඛනය යාවත්කාලීන කළ යුතුය.
(ආ)	දූනගහ උපකාර්යාලය සතු කටුවැල්ලේගම හන්දිය බොන ළිඳ ආසන්නයේ සිටින ඉඩම් හිමියා විසින් අනීතිකව අයිතිකරගෙන වෙනත් පාර්ශවයකට විකුණුම්කර මේ වනවිට එම ස්ථානයේ කඩකාමර කිහිපයක් ඉදිකර තිබුණද සභාව මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	පරීක්ෂාකර බලා අවශ්‍ය කටයුතු කරන බව.	සභාව සතු දේපළ ආරක්ෂා කරගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	පර්චස් 50 ක් පමණ වූ ගලබඩවත්ත /ගොඩිගමුව ඉඩම මායිම් නිශ්චිතව හදුනාගත නොහැකිව වල් බිහිවී, සභාවේ නාම පුවරුවක් හෝ නොමැතිව පැවති අතර පාරක් සකස්කිරීමට ඉඩමේ තිබූ විශාල ගස් බාහිර පුද්ගලයින් විසින් අනවසරයෙන් ගලවා ඇති බව සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	සභාව සතු දේපළ ආරක්ෂා කරගැනීමට කටයුතු කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තනතුරු 10 කට අදාලව කාර්යමණ්ඩලයේ 21 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර ඉන් ආදායම් පරීක්ෂක තනතුරේ අනුමත කාර්යමණ්ඩලය 04 අතරින් 03 ක ගේ පුරප්පාඩු පැවතීම සභාවේ ආදායම් ඉපයීමේ කාර්යය සඳහා ඍජු බලපෑමක් ඇති කරන බව ද, වැඩ/ ක්ෂේත්‍ර පරීක්ෂක හා විදුලි කාර්මික අනුමත තනතුරු සියල්ලම පුරප්පාඩුව පැවතීම සභාවේ මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා ඍජු බලපෑමක් ඇති කරන බව ද විගණනයේදී නිරීක්ෂණය විය.	පුරප්පාඩු සඳහා නිළධාරීන් ඉල්ලුම් කර ඇති බව .	සභාවේ රාජකාරි වල කාර්යක්ෂමතාවයට බලපෑමක් ඇතිනොවන අයුරින් කාර්යමණ්ඩලය කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2025අප්‍රේල් 30 දිනට දින වනවිට සභාවේ සේවයේ නිරත නොවූ නිලධාරින් 08 දෙනෙකුගේ එකතුව රු.41,300 ක සේවක ඇප තැන්පතු මුදල අදාල නිලධාරින් වෙත පියවීමට කටයුතු කර නොතිබුණු අතර මියගිය නිලධාරියෙකුගේ ගිණුම් දෙකක පැවති රු.6,628 ක් වූ ඇපතැන්පත් එම නිලධාරියාගේ උරුමක්කරුවෙකු වෙත නිදහස් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.	නිරවුල් කිරීමට කටයුතු කරන බව.	සේවක ඇප මුදල් නිරවුල් කිරිමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 ජනවාරි 12 දිනැති අංක DMA 2019/01 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 01 ඡේදය අනුව ජාතික විගණන පනතේ අංක (3)40 වගන්තිය හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක (1)134 මගින් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය නිශ්චය කර ඇති අතර අභ්‍යන්තර විගණනය බලපෑම් හෝ කොන්දේසිවලින් තොරව විගණකවරුන්ට අපක්ෂපාති මධ්‍යස්ථ විනිශ්චයන් ලබා දීම සඳහා අවශ්‍යවන විධිමත් කාර්යානුබද්ධ පැවැත්මක් තිබිය යුතු වුවද සභාවේ 2024 වර්ෂය සඳහා මස් කඩ, මාළු කඩ බදුදීම් මිලදී ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවලට හා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කමිටු සඳහා සභාව විසින් අභ්‍යන්තර විගණන නිලධාරින් පත්කිරීම හේතුවෙන් ඉහත පරිදි අපක්ෂපාතී වාර්තාකරණයට හා ස්වාධීනත්වයට බාධා වී තිබුණි.	ඉදිරියේදී නිවැරදිව සිදුකරන බව.	විගණන පනත, මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.